# 17 ක්‍රිස්තුන් වහන්සේට අයත් මම

**ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් තුළින් මෙන් ම ජීවිත ආදර්ශයෙන් ද ප්‍රේමය පදනම් කර ගනිමින් දේව රාජ්‍යයෙහි ගුණාංග දැක්වූ සේක. මෙය බයිබලයේ සඳහන් විශේෂ චරිත දෙකක් තුළින් විමසීමට ලක් කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ජොහාන් 3: 1-15,4: 7-10, පිලිප්පි 2:1-5, 16**

## ජේසුස් වහන්සේ හා නිකදේමුස්


ජේසුස් වහන්සේ සිනගෝගයෙහි මෙන් ම නොයෙකුත් ස්ථානවල ඉගැන්වීමේ යෙදී සිටි නිසා උන්වහන්සේට රබ්බී ලෙස, එනම් ගුරු දේවයාණන් ලෙස ජුදෙව් ජනතාව ආමන්ත්‍රණය කළ බව අපි දනිමු.

ජුදෙව්වන්ගේ ප්‍රධානියකු ව සිටි නිකදේමුස් පරිසිවරයකු මෙන් ම ගුරුවරයකු ද විය. ජේසුස් වහන්සේගේ සමහර ඉගැන්වීම් පිළිබඳ ව පරිසිවරු එකඟ නො වුව ද නිකදේමුස් නම් වූ පරිසිවරයා වරෙක රාත්‍රියේ ජේසුස් වහන්සේ හමු වීම තුළින් අපට පෙනී යන්නේ,

- නිකදේමුස් තමා තුළ තිබූ ගැඹුරු ආත්මික ප්‍රශ්නවලට ජේසුස් වහන්සේ තුළින් පිළිතුරු සෙවීමට දැඩි පිපාසයක් ඇතිව සිටි බව
- ජේසුස් වහන්සේ රාත්‍රියක වුවද තමන්ගේ කාලය හා විවේකය අන් අය වෙනුවෙන් ප්‍රේමයෙන් කැප කළ බව

නිකදේමුස් ජේසුස් වහන්සේ හමු වූ විට පැසුවේ,

**"ගුරු දේවයිනි,
ඔබ දෙවියන් වහන්සේ වෙතින් වැඩම
කළ ගුරුවරයෙක් යැයි
අපි දනිමු.
මන්ද දෙවියන් වහන්සේ
තමා සමග වැඩ නොසිටින සේක් නම්
කිසිවකුට ඔබ කරන මේ හාස්කම්
කළ නොහැකි ය. "
ශු. ජොහාන් 3: 2**



ඉහත බයිබල් පාඨයෙන් අපට පැහැදිලි වන්නේ නිකදේමුස් උසස් සමාජ තත්වයක සිටි පුද්ගලයකු වුවත් ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ සේකැ යි විශ්වාස කළ බව ය. එසේ ම උන්වහන්සේට උතුම් ගෞරවය දෙමින් ඔහු ජේසුස් වහන්සේ සමග සම්බන්ධ වීමට කැමැත්ත දක්වන බවයි. එවන් සම්බන්ධතාවක් ජේසුස් වහන්සේ සමග ගොඩ නගා ගැනීමට ඔහුට අවශ්‍ය ව තිබුණ බව පෙනී යයි. එහෙයින් ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආලෝකයෙන්, පසු කාලයේ දී ඔහුගේ ජීවිතය වෙනස් වූ බව සුබ අස්න තුළින් අපට එළිදරව් වේ.

ජේසුස් වහන්සේගේ ඔහුට දැක්වූ ප්‍රතිචාරය පහත බයිබල් පාඨයෙන් තේරුම් ගනිමු.
ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,

**"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි.**
**යමෙක් නැවත නූපන්නොත්**
**ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැක. "**
**ශු. ජොහාන් 3:3**

ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය නිකදේමුස් නිවැරදි ලෙස වටහා ගත් බවක් නොපෙනේ. එය ඔහු අසන මෙම ප්‍රශ්නයෙන් වඩාත් පැහැදිලි වෙයි. එනම් මිනිසකු මහලු ව සිටියදී නැවත මව් කුසට පිවිසිය හැක්කේ කෙසේ ද යන්නයි.

ඒ අනුව ජේසුස් වහන්සේ විස්තර කළ ඉගැන්වීම අපි දැන් අවබෝධ කර ගනිමු.

❖ **යමකු නැවත නූපන්නොත්** යන්න ප්‍රකාශ කිරීමෙන්,

ගැඹුරු ආත්මික සත්‍යතාවක් ජේසුස් වහන්සේ සරල ලෙස පැහැදිලි කළ බව පෙනේ. නැවත ඉපදීමක් යනුවෙන් ජේසුස් වහන්සේ අදහස් කරන්නේ මේ ලෝකයේ දෙවැනි වරට ඉපදීමක් නොවේ.

මෙලොවට බිහිවන මිනිසා පාපයට බර ව ලොව තුළ ජීවත් වේ. මෙම පාපයෙන් නිදහස් වීමට නම් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ ලෙස අලුත් ජීවිතයක් අත්පත් කරගත යුතු වේ. (ජොහාන් 3:5)

❖ **දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගැනීමට නො හැකි ය** යන්නෙන් අදහස් වන්නේ,

පාපයට වහල් වී සිටින මිනිසා දේව සම්බන්ධතාව බොහෝ විට ප්‍රතික්ෂේප කරයි. එවිට මිනිසාට අත්වන්නේ විනාශය යි. නමුත් සැබෑ ලෙස අලුත් උත්පාදනයකට ජීවිත අභ්‍යන්තර වෙනසකින් ක්‍රිස්තුන් වහන්සේට ප්‍රේම කරමින් උන් වහන්සේ සමග සම්බන්ධ වන විට ඔහු/ඇය මෙලොව දී ම දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ උරුමකම ලබා ගනියි.

ජේසුස් වහන්සේ නිකදේමුස්ට පැවසූ **"නැවත ඉපදීම"** නම් මෙයයි. ජේසුස් වහන්සේ මෙහි දී ප්‍රකාශ කරන්නේ ආත්මයාණන්ගේ උපකාරීත්වය ඇතිව ජීවිත හැරීමක් තුළින් අප අලුත් ජීවිතයක් හෙවත් අලුත් ඉපදීමක් ලැබිය යුතු බවයි. මෙම ජීවිත හැරීම ජේසුස් වහන්සේ කෙරෙහි අදහා ගැනීම මත පදනම් ව පමණක් සිදු විය යුතු ය.


# ජේසුස්වහන්සේ හා සමාරිය ස්ත්‍රිය

**කියවා බලමු.**

**ශු. ජොහාන් 4: 7-10**

ජොහාන් සුභාරංචිය අපට ඉදිරිපත් කරන ජේසුස් වහන්සේ සමග සංවාදයට ඇතුළු වූ තවත් වැදගත් චරිතයක් නම් සමාරියේ ස්ත්‍රිය යි.

ජේසුස් වහන්සේ හා සමාරියේ ස්ත්‍රිය අතර ඇතිවුණු සාකච්ඡාවෙන් ඉස්මතු වන කරුණු අපි විමසා බලමු.



ජේසුස් වහන්සේ -

**"මට වතුර ටිකක් දෙන්න"**

සමාරියේ ස්ත්‍රිය -

***"ජුදෙව්වෙකු වන ඔබ සමාරියේ ස්ත්‍රියක වන මගෙන් බොන්නට ඉල්ලන්නේ කෙසේ ද?***

සාමාන්‍යයෙන් ජුදෙව්වන් හා සමාරියන් අතර කිසි ම සම්බන්ධතාවක් කිසි ලෙසකින්වත් සිදු නො වුණි. එවැන්නක් තිබියදී ම ජේසුස් වහන්සේ ජුදෙව්වෙකු ලෙස සමාරිය ස්ත්‍රියගෙන් වතුර ඉල්ලීම ඇය මවිතයට පත් කළ කරුණක් වීම ස්වභාවික ය. මෙහිදී සැලකිය යුතු වන්නේ,

- ❖ ජුදෙව් ජාතිකයෙකු ලෙස ජේසුස් වහන්සේ සමාරිය ජාතිකයෙකුට කථා කිරීම ය.
- ❖ ජුදෙව් පිරිමියෙකු ලෙස සමාරිය කාන්තාවකට කථා කිරීම ය.

ජේසුස් වහන්සේ මෙහි දී ක්‍රියා කළේ දෙවියන් වහන්සේගේ ප්‍රේමය ජුදෙව්වන්ට පමණක් ලබා දෙන ප්‍රේමයක් නොවන බව පෙන්වීමටයි. එමෙන් ම සමාජයෙන් කාන්තාවන් කොන් කරන වටපිටාවක දී වුව ද ඇයට දයානුකම්පාව දැක්වීමෙන් මිනිසුන්ගේ කුහක කම දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව දැක්වීමට යි.

ජේසුස් වහන්සේ සමාරිය ජාතික කාන්තාවකගෙන් වතුර ඉල්ලීමෙන් සමාජය තුළ බල පවත්නා අනිසි වෛරය, දේව රාජ්‍යයේ පදනම වන ප්‍රේමයෙන් බිඳලිය හැකි බව පෙන්වා දුන් සේක. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය, ජාතිකත්වය වර්ගවාදය අබිබවා ක්‍රියාත්මක වන ප්‍රේමයක් බව මින් අපට පැහැදිලි වෙයි.

එදා සමාජයේ පැවති වර්ගවාදී ආකල්ප නිසා වතුර ඉල්ලීම සමාරියේ ස්ත්‍රියට ප්‍රශ්නයක් වූ බව පෙනේ. සමාජය තුළ පැවති මෙවැනි වටපිටාවක දී වුව ද ජේසුස් වහන්සේ මෙම අන්‍ය ජාතික කාන්තාවට **දෙවියන් වහන්සේ ලබා දෙන සදාතන ජීවනය** හිමි බව ප්‍රකාශ කළ සේක. මෙහිදී උන්වහන්සේ "ඔබ කථා කරන පුද්ගලයා කව්ද කියා ඔබ හරියට දන්නේ නම්, ඔහුට ජීවන ජලය දෙන්නට හැකි බව" පැවසූ සේක.

මෙම ප්‍රකාශනය සම්බන්ධව පහත කරුණු ගෙන හැර පෑ හැකි ය.

1. මෙසියස් වහන්සේ වන තමන් වහන්සේගේ පැමිණීම සැබෑ ලෙස අදහන ප්‍රේමකරන සැමට උන්වහන්සේ කෙරේ පිපාසාවක් ඇතිවීම,

2. එය විස්තර කිරීමට උන්වහන්සේ ජලය පිළිබඳ මිනිස් අවශ්‍යතාව යොදා ගනිමින් ආත්මික පිපාසාව හෙළි කිරීම.

3. මිනිසාගේ සදාතනික පැවැත්ම වන්නේ ජේසුස් වහන්සේ නැමති ජීවන ජලය යි. එයට ඇති පිපාසාව තුළ දේව රාජ්‍යයේ උරුමය ලබා ගත හැකි බවයි.

ක්‍රිස්තුස්වහන්සේ හා සමග සම්බන්ධ වීමට අප තුළ ඇති පිපාසාව, අපගේ ජීවිත ආකල්ප වෙනස් වීම කෙරේ බලපානු ලැබේ. එය පහත බයිබල් පාඨයෙන් තේරුම් ගනිමු.

***ක්‍රිස්තුස්වහන්සේට අයිති වීමෙන් ඔබට යම් ශක්තියක් තිබේ ද?***

***ප්‍රේමයෙහි යම් අස්වැසිල්ලක් තිබේ ද?***

***ආත්මයාණන්වහන්සේ සමග යම් සහභාගීකමක් තිබේ ද?***

***එකිනෙකා කෙරෙහි ආදරයක් හා දයාබර කමක් තිබේ ද?***

**පිලිප්පි 2:1**

එසේ ඇතිවන ආකල්ප වෙනස සියලු පෞද්ගලික අභිමතාර්ථ අබිබවන ක්‍රිස්තුන් වහන්සේ තුළ පවතින ආකල්ප වෙනසක් විය යුතු ය. එය නිකදේමුස් සහ සමාරියේ ස්ත්‍රිය සමග ජේසුස් වහන්සේ පැවැත්වූ සංවාද තුළින් වඩාත් පැහැදිලි වෙයි. මෙය පහත බයිබල් පාඨයෙන් ද ඔබට පැහැදිලි වනු ඇත.

***එසේ නම් ඔබ එක සමාන චේතනා ඇතිව,***
***එක ම ප්‍රේමයෙන් බැඳී එක ම අරමුණකින් එක්සිත්ව සිටීමෙන්***
***මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න.***
***පක්ෂවාදී කමින්වත් පුහු මානයෙන්වත් කිසිත් නොකරන්න.***
***එකිනෙකා තම තමාට වඩා අන් අය උතුම් යැයි යටහත් කමින් සිතන්න.***
***සැම දෙන තම තමාගේ යහපත පමණක් නොසොයා***
***අනුන්ගේ යහපත ගැනද සලකන්න.***
**ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔබ තුළ පවතීවා.**
**පිලිප්පි 2:2-4**

එයාකාරයෙන්, ක්‍රිස්තුස්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවකින් බද්ධ වන අපගේ ජීවිත, අඳුර පළවා හරින ආලෝකය දෙන තාරකා මෙන් බැබළිය යුතු බව අපට පෙන්වා දෙයි.

**ඔවුන් අතර ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්**

**අඳුරු ලෝකයක දීප්තිමත් තාරකාවක් මෙන් බබළන්නාහු ය.**

**පිලිප්පි 2:16**

මින් අදහස් වන්නේ තාරකාවකින් දිස්වන කුඩා එළිය වුව ද, අන්ධකාරයේ දී අගනා ආලෝකයක් බවයි. එලෙස ලෝකය තුළ එළිය දෙන තාරකාවක් වීමට ඔබත් උත්සාහ කරන්න.

**ක්‍රියාකාරකම**

1. "තාරකාවකින් දිස්වන කුඩා එළිය වුවද අන්ධකාරයෙහි දී අගනා ආලෝකයක් වෙයි" යන වදනෙහි අර්ථය ඔබගේ වචනයෙන් ලියා දක්වන්න.

2. ක්‍රිස්තුන් වහන්සේ හා සමග සම්බන්ධ වීමට ඔබ තුළ වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග 5 ක් ලියන්න.